# ෆ්ලුස්සි නීතියට අනුව කෙනෙකු ගෙන්වා ගැනීමේ ක්‍රමය කුමක්ද?

ඊට අදාල ගැසට් නිවේදනය නිකුත් කල පසු වෙබ් අඩවියට පිවිසෙන්න. ඉන් පසු පහත දැක්වෙන ආකාරය අනුගමනය කරන්න.




1. Registrazione sul sistema සැලසුම් පද්දතිය තුල ලියාපදිංචි වීම
ඉලලුම් කරන්නාගේ නම, ගම ආදී විස්තර වලට අමතරව වලංගු භාවයේ පවතින ඊමේල් ලිපිනයක් ඉතා නිවැරදිව මෙහිදී ලබා දිය යුතුය.

2. Richiesta di un modulo di domanda මෝදුලෝවක් සඳහා ඉල්ලුම් කිරීම

3. Installazione del programma di compilazione del modulo di domanda sul personal computer
පෞද්ගලික පරිඝණකය තුලට මෝදුලෝව පිරවීදට අදාල මෘදුකාංගය ස්ථාපනය කිරීම.

4. Importazione e compilazione di un modulo sul proprio personal computer
පෞද්ගලික පරිඝණකය තුලට මෝදුලෝවක් රැගෙන ඒමේ සහ එය පුරවා ගැනීමේ ක්‍රියාවලිය.

2007 දෙසැම්බර් මස 1 දින සිට ඉහත ආකාරයට ඉල්ලුම්පත් සකස් කර ගැනීම දක්වා කටයුතු කල හැකි අතර ඉල්ලුම්පත් යැවීම ආරම්භ වන්නේ දෙසැ. 15 සිටයි.

5. Invio telematico di un modulo compilato
සම්පූර්ණ කල ඉල්ලුම් පත විදුත් ක්‍රමයට යැවීමේ ක්‍රියාවලිය.

<u>ලියාපදිංචි වීමේදී ලබා දිය යුතු පුද්ගල දත්තයන් මොනවාද?</u>

- Cognome (වාසගම)
- Nome (නම)
- Indirizzo e-mail (ඊ මේල් අංකය)
- Data di nascita (උපන් දිනය)
- Password di accesso(ඇතුලු වීම සඳහා මුර පදයක්)

<u>ඉල්ලුම් පත්‍ර පිරවීම සඳහා අවශ්‍ය වන්නේ මොනවාද?</u>

<u>ස්වාමියා සඳහා</u>

හැඳුනුම් පත හෝ පෙර්මෙස්සෝ දි සර්ජෝර්නෝව (විදේශික අයට)
ෆිස්කල් අංකය (CODICE FISCALE)
2006 වාර්ෂික ආධායම් වාර්ථාව DICHIARAZIONE DEI REDDITI DEL 2006 :CUD2007,730,MOD.UNICO 2007
ගෙන්වා ගන්නා අයට නවාතැන් සපයන ලිපිනය
යුරෝ 14,62 ක මුද්දරයක්

<u>සේවකයා සඳහා</u>

වලංගු ගුවන් ගමන් බලපත්‍රයේ කොපියක්. හා එතෙර ලිපිනය.

පොදු ස්ථානයකදී ඉල්ලුම්පත් පුරවන විට අදාල ස්වාමියා නොයන්නේනම් ඒ වෙනුවට බලය පැවරූ ලිපියක් හැඳුනුම් පතේ පිටපතක් සමග රැගෙන යා යුතුය.

<u>ඉල්ලුම් කල හැක්කේ කෙසේද? ඒයා යැවිය යුත්තේ කවදාද?</u>

170,000ක් වන මුලු ගනනට අදාල ඉල්ලුම් පත් යැවීම සඳහා දින තුනක් දක්වා ඇත.
47100ක් නම් කරන ලද රටවල් සඳහා වෙන්කර තිබෙන අතර එම රටකින් කුමන හෝ රැකියාවක් සඳහා සේවකයකු ඉල්ලුම් කරන්නේ නම් ඉල්ලුම් පත් යැවීම ආරම්භ වන්නේ දෙසැම්බර් 15 පෙ. ව. 8.00 සිටයි. (ලංකාවෙන් කෙනෙකු ඉල්ලුම් කරන්නේනම් කුමණ රැකියාවකට වුවත් මෙදිනට ඉල්ලුම් කල යුතුයි)

එසේ නම් කර නැති වෙනත් රටකින් ගෘහ හෝ උපස්ථාන සේවකයකු ඉල්ලුම් කරන්නේනම් එම ඉල්ලුම් පත් යැවීම ආරම්භ වන්නේ දෙසැ. 18 පෙ. ව. 8.00 සිටයි.

අනෙකුත් සියළුම වර්ගයේ ඉල්ලුම් පත් යැවීම ආරම්භ වන්නේ දෙසැ. 21 පෙ. ව. 8.00 සිටයි.
ඉල්ලුම් කල හැකි කාලය මාස 6කි.

<u>එක් පරිඝණකයකින් ස්වාමීන්(**DATORE DI LAVORO**) දෙදෙනෙකුට ඉල්ලුම් කල හැකිද?</u>

ඔව්. එහෙත් එක් ලියාපදිංචියකින් ඉල්ලුම් කල හැක්කේ එක් ස්වාමියෙකුට බැවින් එහිදී වෙන වෙනම ලියාපදිංචි විය යුතුවා මෙන්ම යැවීමේදීද වෙන වෙනම යැවිය යුතුය. එක් අයෙකුට උපරිම ඉල්ලුම් පත් 5ක් යවිය හැකියි. එය ගෘහසේවයට 2යි, උපස්ථාන 2යි, වතු වැඩට 1යි යනාදී ලෙස වෙනස් වෙනස් රැකියා සඳහා හෝ ගෘහ සේවය සඳහා 5ක් යනාදී ලෙස හෝ ලෙස ඉල්ලුම් කල හැකියි.

**එක් සේවකයකු දැනට සිටින විට තවත් කෙනෙකු සඳහා ඉල්ලුම් කල හැකිද?**

ඔව්. අවශ්‍ය වන්නේ ඉල්ලන සේවක සංඛ්‍යාව නඩත්තු කිරීමට ප්‍රමානවත් ආදායමක් පමණයි.

**එකම සේවකයා වෙනුවෙන් ඉල්ලුම් පත් දෙකක් යැව්වොත් කුමක් වේද?**

පරිඝණක ක්‍රමය (සිස්ටම්) විසින් දෙවෙනි ඉල්ලුම් පත ප්‍රතික්ෂේප කරයි.

**වෙනත් පලාතක කෙනෙකුට තවත් පලාතක කෙනෙකු වෙනුවෙන් ඉල්ලුම් කල හැකිද?**

ඔව්. ලියාපදිංචියේදී යොදන්නේ ස්වාමියාගේ විස්තර බැවින් අදාල ඉල්ලුම් පත යොමු වන්නේ අදාල පලාතේ ආයතනයටයි. යවන ස්ථානය වැදගත් නොවේ.

**පෙර්මෙස්සෝ දි සර්ජෝර්නෝව අළුත් කරවා ගැනීම සඳහා බාරදී තිබෙන විට ඉල්ලුම් කල හැකිද?**

ඔව්. එයට කිසිදු බාදාවක් නැත.

**ඉතාලියෙන් පිටුවහල් කල කෙනෙකු ගෙන්වා ගත හැකිද?**

ඉතාලි නීතියට අනුව එසේ පිටුවහල් කල කෙනෙක් විශේෂ අවසරයක් නොමැති විට වසර 10ක් යනතුරු ඉතාලියට ඇතුළුවීම තහනම්ය. එම නිසා එවැනි කෙනෙකු ගෙන්වා ගත නොහැක.

**ඉල්ලුම් කල හැක්කේ කුමණ ස්ථාන වලින්ද?**

පුද්ගලික පරිඝණක පහසුකම් ඇති අයට පුද්ගලිකව එය සිදු කල හැකි අතර එවැනි පහසු කම් නැති අය ව්‍යාපාරික ක්ෂේත්‍රයේනම් ඊට අදාල ව්‍යාපාරික සංවිධාන හරහාද එසේ නොමැති අය වෘතීය සමිති හා අමාත්‍යංශයේ ලියාපදිංචි වෙනත් සංවිධාන හරහාද ඉල්ලුම් කල හැක.

**අන්තර්ජාල මධ්‍යස්ථාන වලින් මෙය කල හැකිද?**

ඔව් එය තහනම් නැත. නමුත් මෙම ක්‍රියාවලිය සඳහා එකම පරිඝණකයක් භාවිතා කල යුතුවා මෙන්ම අදාල දිනය වන තුරු එම පරිඝණකයේ සිය දත්ත ගබඩා කල යුතුය. ඒ සඳහා ආයතනයෙන් අවසර ලැබේනම් තහනමක් නැත.

**අදාල මෘදු කාංගය පරිඝණකයේ ස්ථාපනය නොකර මෙය කල නොහැකිද?**

නැත. අනිවාර්යයෙන්ම එය පරිඝණකයේ ස්ථාපනය කල යුතුය.

**වෙලාවට කලින් යැව්වොත් සිදුවන්නේ කුමක්ද?**

අදාල නියමිත වේලාව එනතුරු පරිඝණක ක්‍රමය විසින් එය බාරගන්නේ නැත. ඒ මොහොතේ එය ප්‍රතික්ෂේප වන අතර ඒ බව නිවේදනයකින් දැනුම් දේ. නියමිත වේලාව පැමිණි විට අදාල සුව්වය භාවිතයෙන් එය නැවත නිවැරදිව යැවිය හැක.

**ඉල්ලුම් පත් ලැබීමේ අනුපිල්වෙල සැකසෙන්නේ කෙසේද? එය දැන ගත හැකිද?**

වෙන වෙනම යැව්වත් පොදු ආයතන වලින් සියල්ල එකට යැව්වත් පරිඝණක ක්‍රමය විසින් බාරගන්නේ එක එක වෙන වෙනමය. ඒ නිසා එම යන්ත්‍රය විසින් ඉල්ලුම්පත තමන් තුලට ලබා ගන්නා අංකයත් වේලාවත් සටහන් කර එක් එක් ඉල්ලුම් පත්‍රයට අදාල වෙන වෙනම නිවේදනයක් මගින් තමන් සැපයූ ඊ මේල් ලිපිනයට යොමු කරයි.

**මුද්දරේ යවන්නේ කෙසේද? එය නැති වුවහොත් සිදුවන්නේ කුමක්ද?**

මුද්දරේ ඇති කෝඩ් අංකය අදාල කොටුවේ පිරවීම පමණයි සිදු වන්නේ. තමන් ස්පොර්තෙල්ලෝ උනිකෝ වෙත කැඳවන දවසේ එය රැගෙන යා යුතුය. එය නැති වුවහොත් වෙනත් මුද්දරයක් ලබා දීම ප්‍රමාණවත් වේ.

**අදාල ලිපි ලේඛන යවන්නේ හෝ බාර දෙන්නේ කෙසේද?**

ඉල්ලුම් පත් තෝරාගැනීමෙන් පසු අදාල පලාතේ ස්පොර්තෙල්ලෝ උනිකෝ වෙත කැඳවන අතර එම අවස්ථාවේදී ඒ සියළු ලිපි ලේඛන බාරදිය යුතුය. ආදායම් වාර්ථාව වගේම නවාතැන් පහසුකම් සැපයීමට අදාල ලිපිලේඛනද එම කැඳවීමේදී බාර දිය යුතුය. ඉල්ලුම් කරන අවස්ථාවේ අවශ්‍ය වන්නේ අදාල ලිපිනය පමණි.

**ඉල්ලුම් කිරීම සඳහා ආදායම කොපමණ තිබිය යුතුද?**

මෙය දක්වා ඇත්තේ සේවකයාට වාර්ෂිකව ගෙවිය යුතු වැටුප මෙන් දෙගුණයක් ලෙසයි. අවම මාසික වැටුප ඔබ සඳහන් කරන රැකියාව හා සතියට ඔබ යොදන පැය ගනන අනුව එය ගනනය වේ. නිදසුනක් ලෙස වාර්ෂික සේවක වැටුප අවම 6000ක් ලෙස ගතහොත් ඉල්ලන්නාගේ වාර්ෂික ආදායම 12000ක් හෝ ඊට වැඩිවිය යුතුය. යැපෙන්නන් සිටීනම් මෙය වෙනස් වේ.

**දෙදෙනෙකුගේ හෝ වැඩි දෙනෙකුගේ ආදායම එකතු කර පෙන්විය හැකිද?**

ඔව්. එකම ලිපිනයේ පදිංචි අයගේ ආදායම එකතු කර පෙන්විය හැකි අතර එකම ලිපිනයක නොවේනම් එසේ එක්කර පෙන්විය හැක්කේ පවුලේ ලේ ඥාතීන්ගේ පමණි. (සැමියා, බිරිඳ, මව, පියා, දූ දරුවන් හෝ සහෝදරයින්)

කෙසේ වෙතත් මේ වන විට ඉල්ලුම් කල හැකි ආකාරය දැක්වෙන විස්තර අන්තර්ජාලයේ අඩංගු කර තිබෙන අතර පහත දක්වන ලිපිනයන් වලින් හා අප විවර ගුවන් විදුලි වෙබ් පිටුව තුල හා ගුවන්දුලියට සවන් දීමෙන් සියළු විස්තර ලබා ගත හැකිය.

## ඔබ පරිශීලනය කල යුතු නිල වෙබ් අඩවිය
## www.interno.it

විස්තර ඇතුලත් වෙනත් වෙබ් අඩවි

www.stranieriinitalia.it www.srilankaitalia.it/www.vivarafm.com

විවර ගුවන් විදුලියට සවන් දීමෙන්. විවර සෑම සෙනසුරාදා දිනම රාත්‍රී 8.30 - 10.30 fm 99.6MHz - fm 99.7MHz

Tel: 03045670 Tel/Fax: 0303771921/0307002219 Mail: radiovivara@yahoo.com